සැකසුම: බී. වයි. පී. රත්නසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු**
**General Cetificate of Education (Adv.Level) Examination, August 2014**

**ගිණුම්කරණය II**
**Accounting II**

**33 S I**

*පැය 3*
*3 hours*

උපදෙස් :
- ✻ **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
- ✻ සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- ✻ අදාළ පෙරවැඩ පිළිතුරු පත්‍රය සමග අමුණන්න

01. සීමාසහිත අනුරුද්ධ සමාගමේ ගිණුම් පොත්වලින් 2014 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ ලැයිස්තුව උපුටාගෙන ඇත.

| | රු.'000' |
|---|---|
| 2013.04.01 තොගය | 2 000 |
| ගැණුම් | 25 000 |
| විකුණුම් | 32 440 |
| වෙනත් ආදායම් | 1 360 |
| බෙදාහැරීමේ වියදම් | 3 120 |
| පරිපාලන වියදම් | 3 100 |
| මූල්‍ය වියදම් | 204 |
| ගෙවූ ලාභාංශ | 200 |
| වෙනත් වියදම් | 900 |
| දේපල පිරියත හා උපකරණ | 10 000 |
| ණයගැතියෝ | 300 |
| ණයහිමියෝ | 200 |
| ප්‍රකාශ කල ප්‍රාග්ධනය (2013.04.01) | 8 000 |
| පොදු සංචිත (2013.04.01) | 2 000 |
| රඳවාගත් ලාභ | 880 |
| 10% බැංකු ණය (2012.04.01 ගත්) | 840 |
| ආදායම් බදු වෙන් කිරීම 2012/2013 | 400 |
| බැංකු හා මුදල් | 1 627 |
| ගෙවූ කල් බදු | 260 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

I 2013 මාර්තු 31 දිනට තොගයෙහි පිරිවැය 3 000 000 කි.

II පිරිවැය රු. 160 000 ක් වූ විකුණුම් මිල රු. 200 000 ක් වූ භාණ්ඩ තොගයක් ගනුදෙනුකරුවන් විසින් ආපසු එවා ඇතත් එම ආපසු එවීම පොත්වල වාර්තා කර නැත. එහෙත් මෙය ඉහත තොගය තුලට නිවැරදිව ඇතුලත් කර ඇත.

III ඉහත තොගය තුල රු. 150 000 ක් පිරිවැය වූ කල් ඉකුත් වූ තොග ඇතුලත්ව ඇත. මේවා රු. 45 000 කට විකිණිය හැකි අතර එසේ විකිණීම සඳහා රු. 8 000 ක වියදමක් දැරිය යුතුය.

IV දේපල පිරියත හා උපකරණ ලෙස දැක්වෙන්නේ 2013.04.01 දිනට ශේෂයන්ය. එහි විශ්ලේෂණය පහත පරිදි වේ.

| | **පිරිවැය** | **ස.ක්ෂය** | **ශුද්ධ අගය** |
|---|---|---|---|
| ඉඩම් | 3 000 | - | 3 000 |
| ගොඩනැගිලි | 4 000 | 800 | 3 200 |
| ලී බඩු හා උපකරණ | 1 500 | 300 | 1 200 |
| මෝටර් රථ | 3 200 | 600 | 2 600 |
| | 11 700 | 1 700 | 10 000 |

V රු. 20 000 ක් පිරිවැය වූ 2010/04/01 දින ලබාගත් ලී බඩු තොගයක් 2013.04.01 දින සම්පූර්ණයෙන්ම විනාශ වී ඇත. ඒ සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන ඇති අතර අලාභයෙන් 50% ක් ගෙවීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත. මේ පිළිබඳව ගිණුම් වල සටහන් කර නැත. ගොඩනැගිලි 5% ක් ද අනෙකුත් ස්ථාවර වත්කම් 10% ක්ද පිරිවැය මත ක්ෂය කෙරේ.

Uva Province Sipsara Udana & studentlanka.com

VI වාර්තාකරන කාලඡේදයේ අවසාන දිනට සිටි රු. 10 000 ක ණයගැතියෙක් බුන්වත් වී ඇති බවට අධිකරණ තීන්දුවක් දී ඇති බව 2014 අප්‍රේල් 20 දින දැනගන්නට ලැබී ඇත. ඒ වන විටත් මූල්‍ය ප්‍රකාශ අනුමත කර තිබුනේ නැත.

VII 2013.04.01 දින සිට විකුණන භාණ්ඩ වෙනුවෙන් ගනුදෙනුකරුවන්ට ප්‍රතිඥාභාර නිකුත්කරයි. වර්ෂයකට රු. 200 000 බැගින් ඒ වෙනුවෙන් ප්‍රතිපාදනය කල යුතුය.

VIII අත්පිට ගැණුම් මිල රු. 600 000 ක් වූ වාහනයක් 2013.04.01 දින කල්බදු ක්‍රමයට ලබාගෙන ඇත. පළමු වාරිකය ලෙස රු. 20 000 ක් එදිනම ගෙවූ අතර ඉතිරි මුදල අප්‍රේල් මාසයෙන්ම ආරම්භ කර සෑම මසකම අගදී රු. 20 000 බැගින් ගෙවිය යුතුය. මුලු වාරික සංඛ්‍යාව 48 කි. පොලිය සරල මාර්ග ක්‍රමයට බෙදාහැරිය යුතුය. ගෙවූ වාරික පමණක් සටහන් කර ඇත. මෙහි සුන්බුන් අගය රු. 200 000 ක් වන බවත් ජීවකාලය වර්ෂ 5 ක් බවත් තීරණය කර ඇත.

IX වර්ෂයට අදාල අධ්‍යක්‍ෂක සංවේතන රු. 80 000 ක් විගණන ගාස්තු රු. 70 000 ක් අර්ථසාධක වියදම් රු. 30 000 ක් පරිපාලන වියදම්වල ඇතුලත්ය. 40 000 ක් මූල්‍ය වියදම් සමන්විත වන්නේ බේරුම් කරන ලද ණයකර වෙනුවෙන් වූ පොලී වලින් සහ බැංකු ණය පොලී වලින්ය.

X 2013.04.01 දින ඉඩම රු. 3 500 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.

XI වර්ෂය තුල රු. 200 000 ක් වටිනා ප්‍රසාද නිකුතුවක් සංචිත භාවිතයෙන් සිදු කර ඇත. මෙය ගිණුම් ගත කර නැත. තවත් රු. 100 000 ක් පොදු සංචිතයට මාරු කළ යුතුය.

XII 2012/2013 වර්ෂයේ ආදායම් බද්ද රු. 350 000 කට එකග වී ඇති අතර 2013/2014 වර්ෂය සඳහා ආදායම් බද්ද රු. 280 000 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍ය වන්නේ ප්‍රසිද්ධ කිරීමට සුදුසු ආකාරයට**

අ. 2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා ආදායම් විස්තරය

ආ. 2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශ

ඇ. 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අදාල අගයන් දක්වන ආකාරය *(ලකුණු 20 යි)*

**02.** අ. අමල් පියල් හා සමන් හවුල් ව්‍යාපාරයක යෙදී සිටියහ. 2014 මාර්තු 31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත වේ.

රු.'000'

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 41 200 | |
| යන්ත්‍රෝපකරණ | 6 500 | |
| ලී බඩු හා උපකරණ | 4 720 | |
| තොගය | 16 880 | |
| ණයගැතියෝ | 12 300 | |
| බැංකු ශේෂය හා මුදල් | 9 060 | |
| ණයහිමියෝ | | 8 940 |
| 2013 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ශේෂ | | |
| අමල් | | 16 000 |
| පියල් | | 16 000 |
| සමන් | | 8 000 |
| 2013 අප්‍රේල් 01 දිනට ජංගම ගිණුම් | | |
| අමල් | | 8 200 |
| පියල් | | 6 520 |
| සමන් | | 5 820 |
| බැංකු ණය 2013.04.01 දිනට | | 1 000 |
| විකුණුම් | | 55 680 |
| විකුණුම් පිරිවැය | 28 640 | |
| වියදම් | 6 860 | |
| | 126 160 | 126 160 |

පහත සඳහන් අතිරේක තොරතුරු ඔබට දී ඇත.

1. පියල් 2014 මාර්තු 31 දින හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත්තේය. පැරණි හවුල් ගිවිසුමේ පහත සඳහන් විධිවිධාන සලසා තිබුනි.

(අ). වර්ෂය මුලදී තිබූ ශේෂයන් මත ප්‍රාග්ධන ශේෂයන්ට 10% ක වාර්ෂික පොලියක් බැර කල යුතුය.

(ආ) හවුල්කරුවෙකු විශ්‍රාම යාමේදී හෝ පිවිසීමේදී කීර්තිනාමය ව්‍යාපාරයේ වත්කමක් ලෙස නොපෙන්විය යුතු අතර එය ප්‍රාග්ධන ගිණුමේ ගැලපිය යුතුය.

(ඇ) අමල්ට හා පියල්ට පිළිවෙලින් රු. 2 000 ක් සහ 3 000 ක් ලෙස මාසික වේතන ගෙවිය යුතු අතර සමන්ට ශුද්ධ ලාභයෙන් 10% ක කොමිස් මුදලක් ගෙවයි.

(ඉ) ඉතිරි ලාභය පිළිවෙලින් 5: 3 : 2 අනුපාතයට බෙදාගත යුතුය.

2. පියල් ගේ විශ්‍රාම ගැනීමෙන් පසු අමල් සහ සමන් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් ව්‍යාපාරය කරගෙන යාමටත් පැරණි හවුල් ගිවිසුමේ කොන්දේසි එසේම පවත්වාගැනීමටත් එකඟවිය.

3. 2014.03.31 දින ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 500 000 කට අගයකර ඇත.

4. විශ්‍රාම යන දිනට පියල්ට රු. 100 000 ක් මුදලින් ගෙවනු ලැබූ අතර ඉතිරි මුදල වර්ෂයකට 15% බැගින් පොලී ගෙවන ණය ගිණුමටකට මාරු කරනු ලැබේ.

5. පෙර වර්ෂයේදී බොල්ණය සේ සලකා ලියා හරින ලද රු. 200 000 ක ලැබිය යුතු වෙළෙඳ ණයක් මේ වර්ෂය තුල ලැබී මුදල් පොත හර කර ණයගැති ගිණුමට බැර කර ඇත. වෙනත් සටහනක් තබා නැහැ.

6. 2014.10.01 දින සිට බැංකු ණය මාසික වාරික 20 න් ආපසු ගෙවිය යුතුය.

**අවශ්‍ය වන්නේ**

I. ශුද්ධ ලාභය ගණනය කිරීම

II. 2014 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා

- හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම
- හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

III. 2014 මාර්තු 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය *(ලකුණු 10 යි)*

ආ. නිර්මල නිෂ්පාදන ආයතනය නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකකින් (A හා B ) සහ එක් සේවා දෙපාර්තමේන්තුවකින් යුක්ත වේ.
ප්‍රාථමික විභජනයෙන් පසු එක් එක් දෙපාර්තමේන්තුව සඳහා වන පොදුකාර්ය පිරිවැය පහත පරිදිවේ.

| | සැකසීම රු. | එකලස්කිරීම රු. | නඩත්තු හා අනෙකුත් සේවා රු. |
|---|---|---|---|
| පොදු කාර්ය පිරිවැය | 114 000 | 342 000 | 24 000 |

සේවා දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය සැකසීම හා එකලස්කිරීම් දෙපාර්තමේන්තු අතර පිලිවෙලින් 1 : 3 අනුපාතයට විභජනය කල යුතුවේ.

සැකසීම දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය යන්ත්‍ර පැය පදනම මතද එකලස් කිරීමේ දෙපාර්තමේන්තුවේ පොදුකාර්ය පිරිවැය සෘජු ශ්‍රම පැය පදනම මතද භාණ්ඩ සඳහා අවශෝෂණය කරයි.
වර්තමානයේ ආයතනය ''කුඩා'' හා ''ලොකු'' වශයෙන් භාණ්ඩ වර්ග 2 ක් නිෂ්පාදනය කරයි. එම භාණ්ඩ පිළිබඳ අයවැයගත විස්තර මෙසේය.

| | **කුඩා** | **ලොකු** |
|---|---|---|
| සෘජු ද්‍රව්‍ය (ඒකකයකට) | 5 kg එකක් රු.20 | 8kg එකක් රු. 20 |
| සෘජු ශ්‍රමය (ඒකකයකට | පැය 3 පැයකට රු. 18 | පැය 4 පැයකට 20 බැගින් |
| වැයවන යන්ත්‍ර පැය (ඒකකයකට) | 1 | 3 |

''කුඩා'' භාණ්ඩය A දෙපාර්තමේන්තුව මගින් ද ''ලොකු'' භාණ්ඩය B දෙපාර්මේන්තුව මගින් ද නිෂ්පාදනය කරයි. ''කුඩා'' භාණ්ඩයෙන් ඒකක 5 000 ක් ද ''ලොකු'' භාණ්ඩයෙන් ඒකක 4 000 ක් ද නිපදවීමට සැලසුම් කරන ලදි.

පළමු නිෂ්පාදන වටයට අදාළ වූ කාලච්ඡේදය ආරම්භයේ සෘජු ද්‍රව්‍ය 2 000 kg තිබූ අතර වර්ෂය තුල 59 000 kg මිලදී ගන්නා ලදි. කුඩා සහ ලොකු සඳහා එකම අමුද්‍රව්‍ය භාවිතා කෙරේ. 'කුඩා' සහ 'ලොකු' භාණ්ඩ 2 පිළිබඳ සත්‍ය තොරතුරු පහත දැක්වේ.

| | **කුඩා** | **ලොකු** |
|---|---|---|
| සත්‍ය යන්ත්‍ර පැය | 5 200 | 11 700 |
| සත්‍ය ශ්‍රම පැය | 14 900 | 16 200 |

අයවැයගත නිෂ්පාදනය සහ සත්‍ය නිෂ්පාදනය සමානය

Uva Province Sipsara Udana & studentlanka.com

අවශ්‍ය වන්නේ

1. නිෂ්පාදන දෙපාර්තමේන්තු හා සඳහා පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත වෙන වෙනම ගණනය කිරීම
2. ''කුඩා'' හා ''ලොකු'' භාණ්ඩ වල ඒකක පිරිවැය ගණනය කිරීම *(ලකුණු 10 යි)*

*(මුළු ලකුණු 20 යි)*

03. අ. ව්‍යාපාරයක් විසින් භාවිතාකරන අමුද්‍රව්‍ය වර්ගයකට අදාලව පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| වරකට ඇනවුම් කරන ප්‍රමාණය | වර්ෂය තුල යවන ඇනවුම් සංඛ්‍යාව | ඇනවුම් පිරිවැය | තොග පවත්වාගෙන යාමේ පිරිවැය |
|---|---|---|---|
| 1 000 | 24 | 19200 | 1200 |

තොගයක් ඇනවුම් කල පසු එම තොගය ලැබීමට අවම වශයෙන් සති 5 ක් ගතවන අතර එම කාලය සඳහා අවම වශයෙන් ද්‍රව්‍ය ඒකක 1500 ක් අවශ්‍ය වේ. සාමාන්‍ය පොරොත්තු කාලය සති 08 කි. සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම කර්මාන්තශාලාව අලුත් වැඩියාවක් සඳහා සති දෙකක් බැගින් වසා තබනු ලැබේ.

**පහත සඳහන් ඒවා ගණනය කරන්න.**

I ආර්ථික ඇනවුම් ප්‍රමාණය

II උපරිම තොග මට්ටම

III අවම තොග මට්ටම

IV යලි ඇනවුම් මට්ටම

V සාමාන්‍ය තොග මට්ටම (උපරිම හා අවම මට්ටම් මත) *(ලකුණු 05)*

ආ. ව්‍යාපාරයක් විසින් බර තැබූ සාමාන්‍ය මිල ක්‍රමයට තොග නිකුත් කිරීම් මිල කරයි. පහත දැක්වෙන්නේ ද්‍රව්‍ය වර්ගයකට අදාල ගබඩා ලෙජර් ගිණුමයි. එය සම්පූර්ණ කරන්න. *(ලකුණු 05)*

**ගබඩා ලෙජර් ගිණුම**

| දිනය | ලැබීම් | | | නිකුත් කිරීම් | | | ශේෂය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | වටිනාකම | ප්‍රමාණය | මිල | වටිනාකම | ප්‍රමාණය | මිල | වටිනාකම |
| 1/2 | 1 000 | 20 | 20 000 | | | | 1 000 | 20 | 20 000 |
| 1/5 | 2 000 | 23 | ---------- | | | | -------- | --------- | ---------- |
| 1/10 | | | | 1 200 | -------- | ---------- | -------- | --------- | ---------- |
| 1/15 | | | | 600 | -------- | ---------- | -------- | --------- | ---------- |
| 1/20 | 2 800 | 25 | ---------- | | | | -------- | --------- | ---------- |
| 1/30 | | | | 1 500 | -------- | ---------- | -------- | --------- | ---------- |

ඉ. සීමාසහිත නර්මදා සමාගමේ යන්ත්‍ර පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

| අංකය | මිලදී ගත් දිනය | පිරිවැය | සුන්බුන් අගය | ජීවකාලය (වර්ෂ) |
|---|---|---|---|---|
| 01 | 2007.10.01 | 500 000 | 100 000 | 05 |
| 02 | 2010.04.01 | 400 000 | 100 000 | 06 |
| 03 | 2011.10.01 | 800 000 | 300 000 | 05 |
| 04 | 2013.10.01 | 900 000 | 300 000 | 06 |

2013.04.01 දින අංක 02 යන්ත්‍රය රු. 280 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදි.

2013.04.01 දින අංක 03 යන්ත්‍රයේ ඉතිරි ප්‍රයෝජවත් ජීවකාලය වර්ෂ 4 ක් බව තීරණය කරන ලදි.

2013.09.30 දින අංක 02 දරන යන්ත්‍රය රු 300 000 කට විකුණා ඇත.

අවශ්‍ය වන්නේ

2014 මාර්තු 31 න් අවසන් වසර සඳහා පහත සඳහන්

I. ගිණුම් යන්ත්‍ර

II. යන්ත්‍ර ක්ෂය වෙන් කිරීම් ගිණුම

III. යන්ත්‍ර ඉවත් කිරීමේ ගිණුම *(ලකුණු 05)*

*(මුලු ලකුණු 15)*

04. (අ) ලාභ අපේක්ෂා නොකරන සංවිධානයක් වන ''උතුරු වසන්තය'' සංවිධානය යුද්ධයෙන් අවතැන් වූවන්ට ආධාර ලබාදීමට සහ ආබාධිත රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල්වල අයට උදව්කිරීම පිණිස සහ නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම පිණිස 2012 ජූනි 01 දින ආරම්භ කරන ලදී. පහත සඳහන් තොරතුරු 2013 මාර්තු 31 න් අවසන් මාස 10 සඳහා එහි ගිණුම් පොත්වලින් උපුටාගන්නා ලදී.

| | රු. 000 |
|---|---|
| විදේශ රටවලින් ලද මුදල් ආධාර | 8 500 |
| දේශීය වශයෙන් ලැබූ මුදල් ආධාර | 3 000 |
| භාණ්ඩ වශයෙන් ලැබුනු ආධාර - රෝද පුටු (50 ක්) | 2 500 |
| සංගමය විසින් පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනයෙහි වාර්ෂික ආදායම | 5 000 |
| පරිපාලන වියදම් (80% ක් නිවාඩු නිකේතනය සඳහා) | 1 000 |
| නිවාඩු නිකේතනයෙහි ආහාර හා වෙනත් ද්‍රව්‍ය | 1 000 |
| විදුලිය (75% ක් නිවාඩු නිකේතනයට) | 80 |
| ණයට මිලට ගත් කෘතිම අවයව (1500 ක්) | 1 500 |
| රෝද පුටු බෙදාහැරීමේ වියදම් | 40 |
| සේවක වැටුප් | 150 |
| මෝටර් රථ පිරිවැයට | 1 000 |

**අමතර තොරතුරු**

1. ආබාධිතයන් අතර රෝද පුටු 40 ක් බෙදාහරින ලද අතර ඉතිරිය සංවිදානය සතුව ඇත.
2. මෝටර් රථ වර්ෂයට 10% ක් ක්ෂය කරනු ලැබේ.

**අවශ්‍ය වන්නේ**

1. රෝද පුටු ව්‍යාපෘති ගිණුම
2. නිවාඩු නිකේතන ගිණුම
3. 2013.03.31 න් අවසන් මාස 10 සඳහා ආදායම් හා වියදම් ගිණුම *(ලකුණු 07)*

(ආ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් දසනායක මහතා නිමි ඇඳුම් මිලට ගෙන විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට තීරණය කරන ලදී. ඒ සඳහා රු. 200 000 ක මුදලක් බැංකු ජංගම ගිණුමක තැන්පත් කර සියළු ගනුදෙනු බැංකු ගිණුම හරහා කරන ලදී.

මාසික කුලිය රු. 8 000 කට ව්‍යාපාරික ස්ථානයක් ලබාගත් ඔහු රු. 80 000 ක වටිනාකමට පැරණි ත්‍රීරෝද රථයක් ද මිලදී ගනු ලැබීය.

2013.04.01 දින ව්‍යාපාරික කටයුතු ආරම්භ කළ අතර 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා පහත විස්තර උපුටාගෙන ඇත.

| ලැබීම් | (රු.) | ගෙවීම් | (රු. |
|---|---|---|---|
| ගනුදෙනුකරුවන්ගෙන් | 620 000 | සැපයුම්කරුවන්ට | 390 000 |
| | | විදුලිය | 60 000 |
| | | ජලය | 12 000 |
| | | කුළිය | 80 000 |
| | | ප්‍රවාහන ගාස්තු | 15 000 |

පහත සඳහන් විස්තරය සපයා ඇත.

(i) 2014.03.31 දිනට ගනුදෙනුකරුවන්ගෙන් තවදුරටත් ලැබිය යුතුව තිබුන මුදල රු. 180 000 කි.

(ii) 2014 මාර්තු මාසය සඳහා විදුලිබිල්පත රු. 6 500 ගෙවා තිබුනේ 2013 අප්‍රේල් මාසයේදීය.

(iii) තම දියණියගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දසනායක මහතා කාර්තුවකට රු. 3000 බැගින් ව්‍යාපාරයේ බැංකු ගිණුමෙන් ලබාගෙන ඇත.

(iv) විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් වර්ෂය තුලදී රු. 800 000 ක් ලැබී එය ද ව්‍යාපාර බැංකු ගිණුමෙහි තැන්පත් කර ඇත. එම මුදලින් රු. 700 000 කට කුඩා ලොරියක් 2013 ඔක්තොම්බර් 01 දින මිලට ගෙන ඇත.

(v) විකුණුම් මිලෙන් 25% දල ලාභයක් ලැබෙන පරිදි භාණ්ඩ අලෙවි කරයි.වර්ෂ අවසානයේ තොගයෙහි වටිනාකම රු. 140 000 කට තක්සේරු කර ඇත.

(vi) ජංගම නොවන වත්කම් වෙනුවෙන් සරලමාර්ග ක්‍රමයට පහත අනුපාතයන්ට අනුව ක්ෂය කල යුතුය. මිලට ගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| ත්‍රී වීලරය | 20% වර්ෂයට | ලොරිය | 10% වර්ෂයට |

Uva Province Sipsara Udana & studentlanka.com

අවශ්‍ය වන්නේ

I දසනායක මහතාගේ ව්‍යාපාරයෙහි 2014.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

II 2014.03.31 දිනට දසනායක මහතාගේ ශේෂ පත්‍රය (ලකුණු 08 යි)

(මුළු ලකුණු 15 යි)

05. අ. මධුගේ ව්‍යාපාරයෙහි 2011 ජනවාරි මස 01 දින ණයගැති ලෙජරයෙහි පහත ශේෂ පැවතුනි.

| | රු. |
|---|---|
| අමල් | 10 000 |
| සුපුන් | 15 000 |
| කාන්ති | 12 000 |
| පාලිත | 8 000 |
| | 45 000 |

ජනවාරි මස පිලියෙල කරන ලද මූලික පොත් කීපයක සාරාංශ පහත පරිදි වේ.

**විකුණුම් ජ'නලය**

| විස්තරය | වටිනාකම (රු.) |
|---|---|
| අමල් | 50 000 |
| සුපුන් | 40 000 |
| කාන්ති | 25 000 |
| | 115 000 |

**පොදු ජ'නලය**

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ආපසු එවුම් ගිණුම හර | 5 000 | |
| අමල්ගේ ගිණුම | | 5 000 |
| (අමල් භාණ්ඩ ආපසු එවීම) | | |
| බොල් ණය ගිණුම හර | 2 000 | |
| කාන්ති | | 2 000 |
| (කාන්තිගෙන් ලැබිය යුතු ණය බොල් ණය ලෙස කපා හරින ලදී) | | |

**ලැබීම් ජ'නලය**

| විස්තරය | මුදල | විශ්ලේෂණ තීරු | | |
|---|---|---|---|---|
| | | විකුණුම් | ණය ගැතියෝ | විවිධ ලැබීම් |
| විකුණුම් | 20 000 | 20 000 | - | - |
| අමල් | 10 000 | - | 10 000 | |
| සුපුන් | 5 000 | - | 5 000 | |
| විකුණුම් | 15 000 | 5 000 | - | |
| ලද ගෙවල් කුලී | 18 000 | - | - | 18 000 |
| කාන්ති | 12 000 | - | 12 000 | |
| අමල් | 7 000 | - | 7 000 | |
| ලද පොලිය | 6 000 | - | - | 6 000 |
| ජීවක | 4 000 | - | 4 000 | - |
| ජනනී | 50 000 | | 50 000 | |
| පාලිත | 6 000 | - | 6 000 | - |
| | 153 000 | 35 000 | 94 000 | 24 000 |

පහත අතිරේක තොරතුරු ඉදිරිපත් කර ඇත.

I. ව්‍යාපාරයක් පාවිච්චි කර ඉවත් කරන ලද ලී බඩු ණයට විකිණීම නිසා ජනනිගෙන් ලද මුදල ද වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම ලෙස දක්වා ඇත.

II. අමල්ගෙන් ණයට භාණ්ඩ ලබාගැනීමක්ද මෙම මාසය තුල සිදු වූ නිසා ඔහුගෙන් ලැබිය යුතු රු. 5000 ක් ඔහුට ගෙවිය යුතු මුදලකට හිලව් කිරීමට තීරණය කර ඇත.

අවශ්‍ය වන්නේ

1. ණයගැති ලෙජරය සහ ණයගැති ශේෂ ලැයිස්තුව
2. පොදු ලෙජරයෙහි ණයගැති පාලන ගිණුම සහ විකුණුම් ගිණුම (ලකුණු 08)

(ආ) අමයුරු ව්‍යාපාරයේ 2013 බැංකු ජංගම ගිණුමට අදාල තොරතුරු පහත දැක්වේ.

**2013 මාර්තු මස බැංකු සැසඳුම් විස්තරය**

| | | | |
|---|---|---|---|
| බැංකු ප්‍රකාශයට අනුව අයිරාව | | | 4 225 |
| **+ ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්** | 25213 | 1 000 | |
| | 25200 | 3 500 | 4 500 |
| | | | 8 725 |
| **- උපලබ්ධි නොවූ තැන්පතු** | 452364 | 2 000 | |
| | 862345 | 3 300 | |
| | 656157 | 1 200 | 6 500 |
| සංශෝධිත බැංකු ශේෂය ( හර) | | | 2 225 |

2013 අප්‍රේල් මාසයේ මුළු චෙක්පත් තැන්පතු වල එකතුව රු. 23 000 කි. අප්‍රේල් මාසයේ මුළු චෙක්පත් නිකුත් කිරීම් වල එකතුව රු. 16 000 විය.

මාර්තු මාසයේ නිකුත් කල චෙක්පත් වලින් චෙක්පත් අංක 25213 පමණක් අප්‍රේල් මාසය තුලදී ගෙවීමට ඉදිරිපත් වී ඇත. මීට අමතරව අප්‍රේල් මාසයේ නිකුත් කල චෙක්පත් වලින් රු. 6 500 ක් වටිනා චෙක්පත් 2013 මැයි මාසයේ ඉදිරිපත් වී ඇත. මාර්තු මාසයේ උපලබ්ධි නොවූ චෙක්පත් වලින් 862345 සහ 452364 යන චෙක්පත් අප්‍රේල් 30 වන දින වන විට උපලබ්ධි වී ඇත. අප්‍රේල් මාසයේ තැන්පත් කල කල අංක 472365 දරණ රු. 2 800 ක චෙක්පත ද අප්‍රේල් මාසය තුල උපලබ්ධි වී නැත.

අප්‍රේල් මාසයේ බැංකුව අයකල බැංකු ගාස්තු රු. 2000 ක් සහ චෙක්පත් ගාස්තු රු. 400 ක් බැංකු ගිණුමේ සටහන් කර නැත.

ගනුදෙනුකරුවෙක් රු. 3 200 ක් බැංකුවට සෘජුවම ඒවා ඇත. මේවා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ වාර්තාකර නැත.

ස්ථාවර නියෝග ලබා දී තිබූ රක්‍ෂණ වාරිකය රු. 1 500 ක් බැංකුව විසින් අප්‍රේල් මාසය තුලදී හරකර ඇත. මෙයද ව්‍යාපාරය විසින් බැංකු ගිණුමේ වාර්තා කර නැත.

**අවශ්‍ය වන්නේ**

I සංශෝධිත බැංකු ගිණුම II. අප්‍රේල් මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය

*(ලකුණු 07)*

*(මුළු ලකුණු 15)*

06. (අ) සීමිත ජයලතා සමාගමෙහි 2014/2014 වර්ෂයට අදාල ආදායම් ප්‍රකාශය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පහත වේ.

| **ආදායම් ප්‍රකාශය** | | රු.'000' |
|---|---|---|
| ගැනුම් | | 57 000 |
| (-) විකුණුම් පිරිවැය | | (44 200) |
| දල ලාභය | | 12 800 |
| වෙනත් ආදායම් | | 500 |
| | | 13 300 |
| බෙදාහැරීමේ වියදම් | 1 760 | |
| පරිපාලන වියදම් | 3 840 | |
| මූල්‍ය වියදම් | 270 | (5 870) |
| බදුවලට පෙර ශුද්ධ ලාභය | | 7 430 |
| (-) ආදායම් බදු | | (2 500) |
| කාලච්ඡේදයෙහි ශුද්ධ ලාභය | | 4 930 |

**හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය**

| | **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | **ප්‍රත්‍යගණන සංචිතය** | **'000' රඳවාගත් ලාභ** |
|---|---|---|---|
| 2013.04.01 | 20 000 | 1 120 | 17 240 |
| කොටස් නිකුතුව | 4 400 | | |
| ඉඩම් ප්‍රත්‍යාගණනය | - | 880 | |
| වර්ෂයෙහි ලාභය | - | - | 4 930 |
| ගෙවූ ලාභාංශ | - | - | (3 000) |
| 2013.03.31 ශේෂය | 24 400 | 2 000 | 19 170 |

පහත අතිරේක තොරතුරු ඉදිරිපත් කර ඇත.

I. පහත දැක්වෙන්නේ 2013.04.01 සහ 2014.03.31 දිනට ඇති වත්කම් සහ වගකීම්වලට අදාල අගයන්වේ.

Uva Province Sinsara Udana & studentlanka.com

| | 2014.03.31 | 2013.03.31 | **වගකීම්** | 2014.03.31 | 2013.03.31 |
|---|---|---|---|---|---|
| **ජංගම වත්කම් (මුදල් හැර)** | 4 538 | 4 814 | බැංකු ණය | 5 700 | 6 800 |
| | | | උපචිත වියදම් | - | 128 |
| | | | ගෙවිය යුතු බදු | 900 | 400 |
| | | | වෙනත් ජංගම වගකීම් | 2 050 | 1 794 |

II. වෙනත් ආදායම් තුල මෝටර් රථ විකිණීමේ ලාභය රු. 400 000 ක් අන්තර්ගත වන අතර වසරේ ක්ෂයවීම් රු. 640 000 ක් පරිපාලන වියදම් තුල අන්තර්ගත වේ. විකුණන ලද රෝටර්රථයේ විකුණු දිනට ධාරණ අගය රු. 1 200 000 ක් විය.

III. මූල්‍ය වියදම් තුල බැංකු ණය සඳහා වර්ෂයට අදාල පොලිය පමණක් අන්තර්ගත වේ.

**අවශ්‍ය වන්නේ**

2013/2014 වර්ෂයට අදාලව මෙහෙයුම් සහ මූල්‍යන ක්‍රියාකාරකම් තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් දක්වන්න. (මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වක්‍ර ක්‍රමය භාවිතා කරන්න) *(ලකුණු 09 යි)*

(ආ) සීමිත ජයසුමන සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කර පහත ගිණුම්කරණ අනුපාත සකස් කර ඇත.

| | 2013.03.31 | 2012.03.31 |
|---|---|---|
| ජංගම අනුපාතය | 5.36 :1 | 4.32 : 1 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 2 : 1 | 0.25 : 1 |
| තොග රැඳවුම් කාලය | දින 20 | දින 29 |
| ණය අනුපාතය | 0.48 | 0.69 |
| පොලී ආවරණ අනුපාතය | වාර 4 | වාර 3 |
| දල ලාභ අනුපාතය | 25% | 20% |

**අවශ්‍ය වන්නේ**

ඉදිරිපත් කර ඇති අනුපාත ඇසුරෙන් සීමිත ජයසුමන සමාගමෙහි පහත සඳහන් තත්වයන් පිළිබඳ ඇගයීමක් කරන්න. මෙහිදී 2012/2013 වර්ෂය 2011/2012 වර්ෂ සමග සසඳමින් පිලිතුර ඉදිරිපත් කරන්න.

I. ද්‍රවශීලතාවය  II. මූල්‍ය ස්ථාවරත්වය  III. ලාභදායිත්වය *(ලකුණු 06 යි)*

*(මුලු ලකුණු 15 යි)*

**07.** සීමිත නදීෂාන් සමාගම ආයෝජන ව්‍යාපෘතියක් පිළිබඳව සලකා බලමින් සිටී. මූලික ආයෝජනය රු. 800 000කි. මෙයින් රු. 200 000ක් 15% පොලියට බැංකුවකින් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතියේ ජීවකාලය වර්ෂ 04 ක් වන අතර එහිදී සුන්බුන් අගය රු. 200 000 කි.

'0' වර්ෂයේදී යෙදිය යුතු කාරක ප්‍රාග්ධනය 50 000 කි. පහත සඳහන් තොරතුරුද සපයා ඇත.

| | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| මෙහෙයුම් මුදල් ප්‍රවාහ | 80 000 | 126 000 | 500 000 | 250 000 |
| 14% වට්ටම් සාධකය | 0.8772 | 0.7695 | 0.6750 | 0.5921 |

බදු අනුපාතය 20% කි. සෑම වර්ෂයකම ආදායම් බද්ධ ඊලග වර්ෂයේදී ගෙවයි. තුන්වන වර්ෂයේ බද්ද සහ 4 වන වර්ෂයේ බද්ද යන දෙකම 4 වන වර්ෂය අගදී ගෙවයි. අවම වශයෙන් වර්ෂ තුනක් තුලදීවත් මූලික ආයෝජනය ආවරණය කර ගැනීමට ආයතනය අපේක්ෂා කරයි.

**අවශ්‍ය වන්නේ**

I. මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කිරීම

II. පිලිගෙවීම් කාලය අනුව එම ව්‍යාපෘතිය තෝරාගත යුතුද යන්න තීරණය කිරීම

III. ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම සහ ශුද්ධ වර්ථමාන අගය මත ආයෝජන ව්‍යාපෘතිය පිළිගත යුතුද? නැද්ද නිගමනය කිරීම *(ලකුණු 08 යි)*

(ආ) ව්‍යාපාරයක් විසින් භාණ්ඩ ඒකක 2 000 ක් නිෂ්පාදනය කරන විට ඒකකයක පිරිවැය රු. 50 කි. නිෂ්පාදනය 25% ක් වැඩි කරන විට ඒකකයක පිරිවැය 10% න් අඩු වේ. ඒකකයක විකුණුම් මිල රු. 50කි.

**අවශ්‍ය වන්නේ**

I ස්ථාවර පිරිවැය ගණනය කිරීම

II සමච්ඡේද ලක්ෂය ගණනය කිරීම (ඒකක සංඛ්‍යාව)

III රු. 100 000 ක ලාභයක් ලැබීම සඳහා අවශ්‍ය විකුණුම් ගණනය කිරීම

IV ස්ථාවර පිරිවැය රු. 40 000 න් වැඩිකර ධාරිතාව[redacted]වැඩිකලේ නම් අලාභ නොලැබීමට අවශ්‍ය විකුණුම් වටිනාකම ගණනය කිරීම

V මුලු විකුණුම් රු. 500 000 කදී ආරක්ෂිත ආන්තික[redacted]ණනය කිරීම *(ලකුණු 07යි)*

*(මුලු ලකුණු 15)*